අහෝ ආදම්ගේ පුතණුවනි, මම රෝගාතුර වූයෙමි. නමුත් ඔබ මාගේ සුවදුක් නොවිමසුවෙහිය යැයි මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ කීර්තිමත් හා සර්වබලධාරී වූ අල්ලාහ් පවසනු ඇත.

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) පැවසූ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ නියත වශයෙන්ම කීර්තිමත් වූ හා සර්වබලධාරී අල්ලාහ් මෙසේ පවසයි: ආදම්ගේ පුතණුවනි, මා රෝගාතුර වූයෙමි. නමුත් නුඹ මාගේ සුවදුක් නොවිමසුවෙහිය. එවිට ඔහු: මාගේ පරමාධිපතියාණනි, ඔබ සර්වලෝකයන්හි පරමාධිපති ව සිටියදී මම ඔබෙන් සුවදුක් විමසනුයේ කෙසේදැ?යි විමිසයි. ඔහු (අල්ලාහ්) : ඔබ නොදන්නෙහි ද නියත වශයෙන්ම මාගේ ගැත්තෙකු වූ මොහු රෝගාතුර ව සිටියේය. නමුත් ඔබ ඔහුගේ සුවදුක් නොවිමසුවෙහිය. ඔබ නොදන්නෙහි ද ! සැබැවින්ම ඔබ ඔහුගේ සුවදුක් විමසුවෙහි නම් ඔහු අසළ ඔබට මා දැකගන්නට තිබිණ. අහෝ ආදම්ගේ පුතණුවනි, මම ඔබෙන් ආහාර පැතුවෙමි. නමුත් ඔබ මට අහාර නොදුන්නෙහිය. එවිට ඔහු: මාගේ පරමාධිපතියාණනි, ඔබ සර්වලෝකයන්හි පරමාධිපති ව සිටියදී මම ඔබට ආහාර සපයනුයේ කෙසේදැ?යි විමිසයි. ඔබ නොදන්නෙහි ද නියත වශයෙන්ම මාගේ ගැත්තෙකු වූ මොහු ඔබෙන් ආහාර පැතුවේය. නමුත් ඔබ ඔහුට ආහාර නොදුන්නෙහිය. ඔබ නොදන්නෙහි ද ! සැබැවින්ම ඔබ ඔහුට ආහාර සපයා ඇත්නම් ඔහු අසළ ඔබට එය දැකගන්නට තිබිණ. යැයි පවසයි. ඔහු (අල්ලාහ්) : අහෝ ආදම්ගේ පුතණුවනි, මම ඔබෙන් ජලය පැතුවෙමි. නමුත් ඔබ මට ජලය නොදුන්නෙහිය. එවිට ඔහු: මාගේ පරමාධිපතියාණනි, ඔබ සර්වලෝකයන්හි පරමාධිපති
ව සිටියදී මම ඔබට ජලය සපයනුයේ කෙසේදැ?යි විමසයි. ඔබ නොදන්නෙහි ද ! නියත වශයෙන්ම මාගේ ගැත්තෙකු වූ මොහු ඔබෙන් ජලය පැතුවේය. නමුත් ඔබ ඔහුට ජලය නොදුන්නෙහිය. ඔබ නොදන්නෙහි ද ! සැබැවින්ම ඔබ ඔහුට ජලය සපයා ඇත්නම් ඔහු අසළ ඔබට එය දැකගන්නට තිබිණ.
යැයි පවසයි.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) පැවසූ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල්ලාහ් මෙසේ පවසයි: ආදම්ගේ පුතණුවනි, මා රෝගාතුර වූයෙමි. නමුත් ඔබ මාගේ සුවදුක් නොවිමසුවෙහිය. එවිට ඔහු: ඔබ සර්වලෝකයන්හි පරමාධිපති ව සිටියදී මම ඔබෙන් සුවදුක් විමසනුයේ කෙසේදැ?යි විමිසයි. එනම් මම ඔබෙන් සුවදුක් විමසන තෙක් මා වෙත කිසිදු අවශ්යතාවක් ඇත්තෙකු ලෙස ඔබ නොසිටියෙහිය යන්නයි. ඔහු (අල්ලාහ්): ඔබ නොදන්නෙහි ද නියත වශයෙන්ම මාගේ ගැත්තෙකු වූ මොහු රෝගාතුර ව සිටියේය. නමුත් ඔබ ඔහුගේ සුවදුක් නොවිමසුවෙහිය. සැබැවින්ම ඔබ ඔහුගේ සුවදුක් විමසුවෙහි නම් ඔහු අසළ ඔබට මා දැකගන්නට තිබිණා නොවේ ද? මෙම හදීසයේ මම රෝගාතුර වූයෙමි. නමුත් ඔබ මගෙන් සුවදුක් නොවිමසුවෙහිය යන උත්තරීතර අල්ලාහ්ගේ ප්රකාශයේ කිසිදු ගැටලුවක් නැත. රෝගය යනු අල්ලාහ්ට තිබිය නොහැක්කකි. රෝගය අඩුපාඩු පෙන්වන ගුණාංගයකි. සුවිශුද්ධ අල්ලාහ් සියලු අඩුපාඩුවලින් තොර වූවෙකි. නමුත් මෙහි රෝගය යනුවෙන් අදහස් කරනුයේ අල්ලාහ්ගේ දැහැමි ගැත්තන් හා ඔහුට ඉතා සමීපවූවන් අතුරින් ගැත්තෙකු රෝගාතුර වීම ගැනය. ඔවුහු ඔහුගේ

http://www.sunnah.global/hadeeth/si/show/5544